# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන)

**2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා විසින්
2015 පෙබරවාරි මස 10 වන දින ඉදිරිපත් කරන ලදී.

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[333 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 008769—475 (2015/02)

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු 'ප්‍රධාන ප්‍රඥප්තිය' යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 34 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) 34 වන වගන්තිය යටතේ පැනවූ තහනම ආනයනකරුවන්ට සහ දුම්කොළ නිෂ්පාදන සැපයීම, බෙදාහැරීම සහ ගබඩා කිරීම සිදු කරනු ලබන තැනැත්තන්ට ව්‍යාප්ත කිරීම;

(ආ) නියෝග මගින්, දුම්කොළ අඩංගු පැකැට්, ඇසුරුම් සහ කාඩ්බෝඩ් පෙට්ටි මත මුද්‍රණය කළ යුතු සෞඛ්‍ය අවවාදවල පරිමාණ, නියෝග මගින් නිශ්චිතව දැක්වීමට හැකි කරවන විධිවිධාන ඉවත් කිරීම;

(ඇ) 34 වන වගන්තිය යටතේ වරදකරුවකුට පනවන දඩ මුදල වැඩි කිරීම.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 34අ වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ සෞඛ්‍ය අවවාද ප්‍රදර්ශනය කළයුතු ආකාරය නිශ්චිත දැක්වීම වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ "සෞඛ්‍ය අවවාද" යන්නට අර්ථ නිරූපණයක් ඇතුළත් කිරීම වේ.

***5 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් දැනට පවතින දුම්කොළ නිෂ්පාදන තොගවල නිෂ්පාදකයන්ට සහ ආනයනකරුවන්ට 34අ වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම සඳහා 2015 ජූනි මස 1 වන දින දක්වා සහන කාලසීමාවක් ප්‍රදානය කරනු ලැබේ.

***6 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් සංශෝධන පනත ක්‍රියාත්මකවන දිනයට පෙරාතුව ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සමග කියවිය යුතු 30 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට අඛණ්ඩව බලාත්මකවීම සඳහා විධිවිධාන සලස්වනු ලැබේ.

# දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන)

එල්.ඩී.—ඕ. 8/2015.

## 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** මේ පනත 2015 අංක   දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන 2015 පෙබරවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2006 අංක 27 දරන පනතේ 34 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ, 34 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"සෞඛ්‍ය අවවාදයක් සහ තාර සහ නිකොටින් ප්‍රමාණය පිළිබඳ ලේබලයක් හෝ ප්‍රකාශයකින් තොරව දුම්කොළ නිෂ්පාදන, නිපදවීම, ආනයනය කිරීම, විකිණීම යනාදිය තහනම් බව.

34. (1) දුම්කොළ නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින් නිෂ්පාදනය කරනු ලබන හෝ ආනයනය කරනු ලබන, දුම්කොළ නිෂ්පාදන ඇතුළත්වන සෑම පැකැට්ටුවක, ඇසුරුමක හෝ කාඩ්බෝඩ් පෙට්ටියක ම ඉදිරිපස සහ පිටුපස යන දෙපැත්තේ ම ඉහළ මතුපිට පෘෂ්ඨයේ එම පැකට්ටුවේ, ඇසුරුමේ හෝ කාඩ්බෝඩ් පෙට්ටියේ ඇති එක් එක් දුම්කොළ නිෂ්පාදනයේ අඩංගු තාර සහ නිකොටින් ප්‍රමාණය නිශ්චිතව දැක්වෙන ලේබලයක් හෝ ප්‍රකාශයක් 34අ වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, නියම කරනු ලැබිය හැකි පරිදි වූ, සෞඛ්‍ය අවවාදයක් ද, සමග පැහැදිලිව මුද්‍රණය කර ප්‍රකටව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කිරීමට සලස්වා තිබිය යුතු ය.

(2) යම් පැකැට්ටුවක, ඇසුරුමක හෝ කාඩ්බෝඩ් පෙට්ටියක ඇති එක් එක් දුම්කොළ නිෂ්පාදනයේ

අඩංගු තාර සහ නිකොටින් ප්‍රමාණය (1) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි නිශ්චිතව දැක්වෙන ලේබලයක් හෝ ප්‍රකාශයක්, සෞඛ්‍ය අවවාදයක් ද සමග ඒ පැකට්ටුවේ, ඇසුරුමේ හෝ කාඩ්බෝඩ් පෙට්ටියේ ඉදිරිපස සහ පිටුපස යන දෙපැත්තේම ඉහළ මතුපිට පෘෂ්ඨය මත ප්‍රදර්ශනය කර ඇත්නම් මිස, යම් දුම්කොළ නිෂ්පාදන අඩංගු පැකැට්ටුවක් යම් තැනැත්තකු විසින් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, සැපයීම, බෙදාහැරීම හෝ ගබඩා කිරීම නොකළ යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.''.

*ප්‍රධාන ප්‍රඥප්තියට 34අ වගන්තිය ඇතුළත් කිරීම.*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 34අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

*"සෞඛ්‍ය අවවාද කෙසේ ප්‍රදර්ශනය කළ යුතු ද යන්න.*

34අ. (1) සිගරට් සහ වෙනත් දුම්කොළ නිෂ්පාදන නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු, ඔහු විසින් නිෂ්පාදනය කරනු ලබන හෝ ආනයනය කරනු ලබන සිගරට් හෝ වෙනත් දුම්කොළ නිෂ්පාදන අඩංගු සෑම පැකැට්ටුවක, ඇසුරුමක හෝ කාඩ්බෝඩ් පෙට්ටියක ම ඉදිරිපස සහ පිටුපස දෙපැත්තේ ම ඉහළ මතුපිට පෘෂ්ඨයේ (මූලිකව ප්‍රදර්ශනය වන ප්‍රදේශයේ) සියයට අසූවක ප්‍රතිශතයකින් යුත් ප්‍රදේශයක් ආවරණය වන පරිදි 34 (1) වගන්තියේ සඳහන් කර ඇති සෞඛ්‍ය අවවාදය පැහැදිළිව මුද්‍රණය කර ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීමට සැලැස්විය යුතු ය.

(2) සිගරට් හෝ වෙනත් දුම්කොළ නිෂ්පාදන භාවිතය මගින් සිදු විය හැකි සෞඛ්‍යයට අනතුරුදායක තත්ත්වයන් සහ හානිකර බලපෑම් පිළිබඳ ඉහත කී සෞඛ්‍ය අවවාදවල, නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් දක්වා තිබිය යුතු ය.

(3) පැකැට්ටුවේ, ඇසුරුමේ හෝ කාඩ්බෝඩ් පෙට්ටියේ ඉදිරිපස සහ පසුපස ඇති සෞඛ්‍ය අවවාද එකිනෙකට වෙනස් විය යුතු ය.

(4) නිෂ්පාදකයකු විසින් සිගරට් සහ වෙනත් දුම්කොළ නිෂ්පාදන වර්ග එකකට වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කරන අවස්ථාවක, එම නිෂ්පාදකයා විසින් නිෂ්පාදනය කරනු ලබන එකිනෙකට වෙනස් වර්ගවල සිගරට් හෝ දුම්කොළ නිෂ්පාදන සමගාමීව එකම සෞඛ්‍ය අවවාදය නොදරන බවට නිෂ්පාදකයා වගබලා ගත යුතු ය.

(5) සිගරට් හෝ වෙනත් දුම්කොළ නිෂ්පාදන පැකට්, ඇසුරුම් හෝ කාඩ්බෝඩ් පෙට්ටි මත ප්‍රදර්ශනය කර ඇති සෞඛ්‍ය අවවාද, සෑම ශ්‍රේණියකම නියමිත සෞඛ්‍ය අවවාදවල වූ සියළු නියමිත වර්ගවල සෞඛ්‍ය අවවාද ආවරණයවන පරිදි මාස හයකට එක් වරක් බැගින් වෙනස් කරනු ලැබිය යුතු ය.

(6) සිගරට් සහ වෙනත් දුම්කොළ නිෂ්පාදනවල, නිෂ්පාදකයන් සහ ආනයනකරුවන් විසින් අධිකාරියෙන් පමණක් ලබාගත හැකි නියමිත සෞඛ්‍ය අවවාද ඇතුළත් සංයුක්ත තැටිය භාවිත කළ යුතු බව නියම කරනු ලැබේ.''.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ "සභාපති" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

" "සෞඛ්‍ය අවවාද' යන්නට පින්තූර හෝ චිත්‍ර රේඛන සහ පණිවුඩ ඇතුළත් වේ.".

අන්තර්කාලීන විධිවිධාන.

**5.** මේ පනතේ 1(2) වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, දැනට පවතින දුම්කොළ නිෂ්පාදන තොගවල නිෂ්පාදකයන්ට සහ ආනයනකරුවන්ට 34අ වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම සඳහා 2015 ජුනි මස 1 වන දින දක්වා සහන කාලසීමාවක් ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

ව්‍යාවර්තන.

**6.** 2015 පෙබරවාරි මස 1 වන දිනට පෙරාතුව ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සාදන ලද සෑම නියෝගයක් ම මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට 2015 පෙබරවාරි මස 1 වන දින සිට අඛණ්ඩව බලාත්මකව පවතින බවට සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 වන ව්‍යවස්ථාව යටතේ සහතිකය**

ඉහත දැක්වෙන පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයේ අදහස අනුව ජාතියේ හිත පිණිස වහා අවශ්‍ය වන්නා වූ පනත් කෙටුම්පතක් බවට මෙයින් සහතික කරමි.

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩල ලේකම්.

2015 ජනවාරි මස 28 දින.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.